නාමල් උඩලමත්ත

*Poster*

# නිසඳැසත් කවියක්ද?

ඕනෑම සාහිත්‍ය කලා නිර්මාණයකට ඊට අනන්‍ය ආකෘතියක් තිබේ. කිසියම් නිර්මාණයක් කවියක්, නවකතාවක්, කෙටිකතාවක්, ගීතයක් හෝ වේදිකා නාට්‍යයක් වශයෙන් අර්ථ දක්වන්නේ එකී ආකෘතිකමය සාධකය පදනම් කරගෙනය. 1940 දශකයේ හඳුන්වා දුන් නිසඳැස් හෙවත් නිදහස් කවිය නම් නිර්මාණ විශේෂය සිංහල කවියේ එකී ආකෘතික අනන්‍යතාව නොතකා හරින ලදී. එහි ප්‍රතිඵලය, පද්‍ය ආකෘතිය පුළුල් වීමද නොඑසේ නම් අභිනව නිර්මාණ විශේෂයක් පහළ වීමද යන්න විමසා බැලීම මේ අධ්‍යයනයේ අරමුණයි.

ශ්‍රීමත් දණ්ඩීන් භාරතයේ එතෙක් බිහිවූ සෞන්දර්යාත්මක භාෂාමය නිර්මාණ සිය *කාව්‍යාදර්ශය* නම් කෘතියේ ගද්‍ය, පද්‍ය සහ චම්පු කාව්‍යය යැයි කොටස් තුනකට බෙදා දැක්වීය. සියබස්ලකරකරු ඒවා සිංහලයට අනුවර්තනය කොට තිබේ. ඒ, මෙරට ජනප්‍රියවූ පද්‍ය කාව්‍ය උදෙසා විචාර පදනමක් ගොඩනැගීම සඳහාය.

මෙම මූලග්‍රන්ථ අනුව පද්‍ය යනු ඡන්දස් එනම් අක්ෂර හෝ මාත්‍රා නියමය අනුව බඳින ලද කාව්‍යයයි. ඡන්දසට අනුගත නොවී බඳනා ලද්දේ ගද්‍ය කාව්‍යයයි. ගද්‍ය පද්‍ය දෙක මිශ්‍ර කොට බඳනා ලද්දේ චම්පු කාව්‍යයයි. මේ අනුව ගද්‍ය පද්‍ය එකිනෙකින් වෙන්කොට හඳුනා ගන්නේ ඡන්දස පදනම් කරගෙන බැව් පැහැදිලිය.

1946 *පළිගැනීම* කෙටි කතා සංග්‍රහය ඔස්සේ ජී.බී. සේනානායක හඳුන්වා දුන් අභිනව නිර්මාණ විශේෂය ඡන්දස් නොතකා රචිතය. කතුවරයාද එය පැහැදිලි කර තිබේ. එහෙයින් ඇතැම් අය මේවා නිසඳැස් යැයි හැඳින්වූහ. සඳැසින් තොර සියලු නිර්මාණ, එනම් සියලු ගද්‍ය නිසඳැස් හෙයින් මේ අනුචිත යෙදුමකි. මෙම නිර්මාණ 'සාම්ප්‍රදායික විරිතින් මිදුනද නව විරිත් ඇත' යන අරුතින් ඇතැමුන් නිදහස් කවි යැයි හැඳින්වුවද ඒවා ගද්‍ය වේ. එනම් පද්‍ය නොවේ. විරිතකට අනුගත නම් ඒවා නිදහස් කවි නොව පද්‍ය වේ. එසේම ඇතැම් විචාරකයින් එළු සඳැස්ලකුණ උපුටා දක්වමින් පවසන්නේ සිංහල බසින් ලියන සියල්ල  සිංහලයේ කවර විරිතකට හෝ අයත්වන බවය. එහෙත් විරිත් ඇත්තේ ඡන්දස් තුළ බව ඔවුහු අමතක කරති.

මෙකී නිර්මාණ පැරණි කවි මෙන් රසවත් බවත් එහෙයින් ඒවාද කවි බවත් ඇතැමුන් පවසති. එහෙත් රසවත් සියල්ල කවි නොවන්නා සේම යමක් රසවත් වූ පමණින් එය කවියක් නොවේ. මෙකී වර්ගීකරණය රසය නොව ආකෘතිය පදනම් කරගත් හෙයින් ඡන්දසකට අනුගත නොවේ නම් කෙතරම් රසවත් වුවද එය ගද්‍යයකි.

මේ අනුව උක්ත නිර්මාණ විශේෂය පද්‍ය යැයි හැඳින්වීමට කිසිදු පදනමක් නොමැති බව පැහැදිලිය. ශාස්ත්‍රීය පදනමක් සහිත දණ්ඩීන්ගේ විග්‍රහය අනුව ඒවාට ගද්‍ය යැයි නොපැවසීමට හේතුවක්ද නොමැත. මේ, නවකතාව හෝ කෙටිකතාව මෙන්ම ගද්‍ය විශේෂයකි. කෙටි කතාවටද වඩා සංක්ෂිප්ත නිර්මාණ විශේෂයකි. මේ නිර්මාණ ගද්‍ය කාව්‍ය විශේෂයක් ලෙස හැඳින්වීම නිදොස් වුවද පද්‍ය හෙවත් කවි යැයි හැඳින්වීම සදොස්ය. ඒවා උපතින්ම පද්‍ය නොවන නිසා පද්‍ය ආකෘතියට සිදුවන බලපෑමක් නොමැත. සැබවින්ම සිදුවී ඇත්තේ අභිනව නිර්මාණ විශේෂයක් පහළ වීමය. එහෙයින් කළ යුත්තේ මේ ගද්‍ය කාව්‍ය විශේෂයට සුදුසු නමක් දීමය.